# රෝහණයේ මහානුග්ගල චේතිය, කුලබරිය මහ විහාරය විය හැකි වර්තමාන නීලගිරි මහ සෑය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

ඩබ්.එම්. චින්තක සඳරුවන්

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය chinthakasandaruwan13@gmail.com

ප්‍රමුඛ පද- රෝහණය, නීලගිරිය, ශිලා ලේඛන, මහානුග්ගල චේතිය, මහා විහාරය.

## හැඳින්වීම

රෝහණ රාජධානියේ ආරම්භය ඉන්දියාවේ සිට පැමිණි භද්දකච්චායනාගේ සහෝදර පිරිසකගෙන් ජනාවාස වූ බව සඳහන් වේ (ම.ව. 220220:6-11). මූලාශ්‍රගත තොරතුරු අනුව ක්‍රි.පූ. 3 වැනි සියවසේ දී මෙම ප්‍රදේශය පිළිබඳ ව මහාවංසයේ සඳහන් වන්නේ කතරගම ක්ෂත්‍රීන් හා චන්දන ග්‍රාමයේ ක්ෂත්‍රීන් පිළිබඳ විස්තර තුළිණි (එම, ixx:53). කෙසේ වෙතත් රෝහණ රාජධානියේ වර්ධණීය දෙ වැනි පෑතිස්ස රජුගේ සහෝදරයකු වූ උපරාජ ධූරය දැරූ මහානාග කුමරු රාජ කුමන්ත්‍රණයක් හරහා රෝහණයට පලා යාමත් සමඟ උප රාජධානියක් රෝහණය කේන්ද්‍ර ගත ව පිහිටුවා ගත් බව සඳහන් වීමෙනි (එම, xxii:1-9). අනුරාධපුර, පොළොන්නරු යුගයන්ට සාපේක්ෂ ව දියුණු සංස්කෘතියක නටබුන් වර්තමානය වන විට රෝහණ රාජධානිය පිහිටි පෙදෙස් තුළින් අනාවරණය වෙමින් පවතින අතර මෙම රචනය තුළින් සාකච්ඡාවට බඳුන් වන්නේ ලාහුගල ප්‍රදේශය ආශ්‍රිත ව මහාවංසයේ සඳහන් **මහානුග්ගල චේතිය** ලෙසත්, ශිලාලේඛන තුළ කුලබරිය විය හැකි වර්තමාන නීලගිරි මහා ස්තූපය හා එහි ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක පසුබිමත් සොයා බැලීමයි.

## ක්‍රමවේදය

නීලගිරිය පුරාවිද්‍යාත්මක ස්ථානය පිළිබඳ පර්යේෂණාත්මක තොරතුරු ඒකරාශි කිරීම සඳහා ක්ෂේත්‍ර ගවේෂණ කිහිපයක් සිදු කළ අතර එහි දි අංකිත කැමරාවක් මඟින් පුරාවිද්‍යාත්මක සාධක ඡයාරූප ගැනීම සිදු කරන ලදි. එසේ ම මූලාශ්‍ර ගවේෂණය සඳහා පුස්තකාල ගවේෂණයත් අන්තර්ජාල ගවේෂණය කිරීම ද සිදු කරන ලදි. එසේ ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සිදු කර ඇති විද්‍යාත්මක වාර්තා අධ්‍යයනය කිරීමත් සිදු කරන ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ලාහුගල පුරාවිද්‍යා ස්ථාන පිළිබඳ ව මුලින් ම ඒ. ඇම්. හෝකාට් විසින් 1930 Archaeology Survey of Ceylon (vol, 220 part 220), නම් වෙළුමේ වාර්තා කරයි. 1929 පාලන වාර්තාවට අනුව වැඩ බලන පුරාවිද්‍යා කොමසාරිස්වරයෙකු ලෙස සිටි ජෝසප් පියර්සන් විසින් නීලගිරි පුරාවිද්‍යා ස්ථාන පවතින භූමි පුරාවිද්‍යා රක්ෂිත ඉඩම් බවට පත් කර ඇත. පසුව සී. ඩබ්. නිකොලස් 1963, හාන්දුහල්පොල පුඤ්ඤරතන හිමි, එල්ලාවල මේධානන්ද හිමි 1965, 1981 වර්ෂවලත් මෙම ස්ථානය වාර්තා කරන අතර 1970 දශකයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් මෙම ස්තූපයේ කොටසක් කැනීම් කර සංරක්ෂණය කළ

බව සඳහන් වේ. 2011 වර්ෂයේ දී රාජ් සෝමදේව විසින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ මෙම ක්ෂේත්‍රය ගවේෂණයක් සිදු කර ඇත. 2011 වර්ෂයේ සිට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් මෙම දාගැබ හා ඉන් පිටත ප්‍රදේශය පුරා ගවේෂණ සිදු කර ස්තූප කැනීම් ආරම්භ කිරිම හා සංරක්ෂණ කටයුතු සිදු කිරිම කරගෙන යනු ලැබේ.

මෙම පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍රය පිළිබඳ ව සොයා බැලීමේ දී ශිලා ලේඛන සාධක ඉතා වැදගත් වේ. ස්තූපයට ඊසාන දිශාවේ ශිලා ලේඛනයක **'උත්තර සීවලි පවත'** වෙත ක්‍රි.පු. 19- ක්‍රි.ව 9 වැනි සියවසේ රාජ්‍යය කළ භාතිකාභය තිස්ස (රා, 1997:107) රජුගේ බිසව වූ චුලසීව දේවිය විසින් කරන ලද ප්‍රධානයක් පිළිබඳ ව සඳහන් වේ (Somadeve, 2011:12). ක්‍රි.ව. 3-4 සියවස්වලට අයත් ශිලා ලේඛනයක ජෙට්ට තිස්ස නම් පාලකයෙක් භික්ෂුන් වහන්සේලාට කළ ප්‍රධානයක් පිළිබඳ ව කරුණු දක්වා ඇත. ක්‍රි.ව. 3 වැනි සියවසට අයත් තවත් ශිලා ලේඛනයක **'වියහවිය'** නම් පුද්ගලයකු **'කුලබරිය'** නම් විහාරයට අරියවංශ සූත්‍ර දේශනා පැවැත්වීම සඳහා වාර්ෂික ව කහවණු විස්සක් පූජා කළ බව සඳහන් වේ. එම ලිපියේ එන **'කුලබරිය මහ විහර'** බොහෝ විට ක්‍රිස්තු වර්ෂ යුගයේ දී නීලගිරිය හඳුන්වන්නට යොදා ගන්නට ඇතැ'යි විශ්වාස කළ හැකි ය (විජේතුංග, 2013:256-260).

හන්දුපැලේපාල පුඤ්ඤරතන නා හිමියන් දක්වන පරිදි නීලගිරිය වංසකතාවල එන **මහානුග්ගල චෛතිය** එය විය හැකි බව ප්‍රකාශ කරයි (මෙධානන්ද, 2003:118). කාවන්තිස්ස රජු මහා නුග්ගල චෛතිය කරවා එහි උත්සව සඳහා මහා සංඝයා රැස් කරවා දන් දී අවසානයේ දස මහ යෝධයන් කැඳවා ගැමුණු හා තිස්ස කුමාරවරුන් අතර සටනක් සිදුවුවහොත් පැත්තක් නොගත යුතු බවට ගිවිසගත් බව මහාවංසයේ සඳහන් වේ (ම.ව, *221221221221*:8-11). හෝකාර්ට්ගේ වාර්තාවන් තුළින් ප්‍රදේශයේ පවතින ජනප්‍රවාදයක් පිළිබඳ ව සඳහන් කරයි. එහි සඳහන් වන පරිදි මෙම ස්තූපය කරවන ලද්දේ අනුරාධපුර යුගයේ පාලකයකු වූ සුරතිස්ස රජු විසිනි (මෙධානන්ද, 2003:117).

නීලගිරි ක්ෂේත්‍රය ආශ්‍රිත ව හමුවන ප්‍රධානත ම වාස්තුවිද්‍යාත්මක නිර්මාණය වන්නේ නීලගිරි ස්තූපයයි. 1965 දශකයේ මෙම ස්ථානය ආශ්‍රිත ව සිදු කර ඇති පූර්ව ගවේෂණ වාර්තා දක්වමින් මෙධානන්ද හිමි දක්වන්නේ ස්තූපය ස්වභාවික උවදුරු හේතුවෙන් ශාක පද්ධතීන් ස්ථාපිත වීම නිසා මුළුමනින් ම ගරාවැටී පැවති බව දක්වා ඇත (එම, 117). 1970 දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් මෙහි ගර්භයේ කොටසක් සංරක්ෂණය සිදු කර ඇත (ලාහුගල නීලගිරිය සෑය කැණිම් වාර්තාව I 2011-2014). නීලගිරි ස්තූපය සම්බන්ධයෙන් විධිමත් කැනීම් හා ගවේෂණ ආරම්භ වන්නේ 2011 වර්ෂයේ දී ය. ඒ වන විටත් ස්තූපයේ ඉහළ කොටස සම්පූර්ණයෙන් ම විනාශව පැවති අතර ස්තූප නිර්මාණයේ මුල් යුග තුළ පැවති යූප කණුව ස්තූපයේ ඉහළ කොටසේ දැකගත හැකි අතර ඡත්‍ර යෂ්ටිය ස්තූප මළුවේ දැකගත හැකි ය. ස්වභාවික ව්‍යසනයන්ට ලක් වීම නිසාවෙන් ස්තූපයේ මුල් ආකෘතිය පැහැදිලි ව හඳුනාගැනිමට අපහසු වේ. නිධන් හොරුන්ගේ ක්‍රියාවලි හේතුවෙන් ස්තූපය මුදුනේ සිට මධ්‍යයට වන්නට අනවසර කැනීම් කිරීම නිසා ද ඇතැම් සාධක විනාශ වී ගොස් ඇත. 2011 වර්ෂයේ දී ස්තූපය ආශ්‍රිත ව කැනීම් කිහිපයක් සිදු කරන අතර ඒවායේ අරමුණු වී ඇත්තේ දාගැබ් ගර්භය හා මළුව අනාවරණය කර ගැනිමයි. ගර්භය පාදා ගැනීම සඳහා සිදු කළ කැනීම් අතර තුර ධාතුන් වහන්සේලා සහිත රන් කරඬු

දෙකක් හමුවීම විශේෂිත වේ. 2012 වර්ෂයේ දාගැබේ ගරා වැටුණු පස් තට්ටු ඉවත් කරමින් ස්තූපයේ ඉදිකිරීම් අවධි හඳුනාගැනීමට කටයුතු සිදු කර ඇත. මෙම යුගයේ කැනීම් මඟින් ස්තූපය ආශ්‍රිත ව සිරිපතුල් ගල්, ආසනගල් හා ඡත්‍ර යෂ්ටි විශාල ප්‍රමාණයක් හමු ව ඇත. 2013 වර්ෂයේ දී ස්තූපයේ උතුරු, බටහිර හා නැගෙනහිර කාර්තු කැනීම් මඟින් බටහිර මල් ආසනය ඊට සම්බන්ධ වේදිකාව, සළපතල මළුව හා සිරිපතුල් ගල් මෙන් ම ආසන ගල් ද මතු කර ගෙන ඇත. 2014 වර්ෂයේ ද ස්තූප ගර්භය පාදා ගැනීම සඳහා කැනීම් සිදු කර ඇති අතර පුරාවස්තු ගණනාවක් ද හමු වී ඇති මෙම ක්ෂේත්‍රය තුළ වර්තමානය වන විට මෙම සංරක්ෂණ මට්ටමේ පවතී.

රෝහණයේ රාජධානියට අයත් නැගෙනහිර පුරාවිද්‍යා ස්ථානයන් පිළිබඳ ව ත්‍රස්තවාදී උවදුරු හේතුවෙන් මැදිහත්වීම් සිදුව ඇත්තේ අවම වශයෙනි. මෙම නිසා පුරාවිද්‍යාත්මක ස්ථාන හා පුරාවස්තූන්ට බොහෝ හානි සිදු ව ඇති ලාහුගල වනෝද්‍යානය තුළ පිහිටා ඇති නීලගිරි පුරාවිද්‍යා ස්ථානයත් ස්වභාවික හේතු, මානව මැදිහත්වීම් මත විනාශ වීමට ලක්ව පැවති ස්ථානයක් වන අතර වර්තමානය වන විට මෙහි ප්‍රධානත ම පුරාවිද්‍යාත්මක අංගය වන ස්තූපය සංරක්ෂණ මට්ටමේ පවතී. ලාංකේය ඉතිහාස අධ්‍යයනයේ මෙම ප්‍රදේශ ආශ්‍රිතව පවතින පුරාවිද්‍යාත්මක සාධක අධ්‍යයනය කිරීම තුළින් නව ඉතිහාසාත්මක කරුණු අනාවරණය කර ගත හැකි අතර ඒ සඳහා යොමු වීම පුරාවිද්‍යාඥයින්ගේ හා ඉතිහාසඥයින්ගේ යුතුකමක් හා වගකීමක් වන්නේ ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


*මහාවංසය* (1996) ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ.

මෙධානන්ද හිමි (2003) එල්ලාවල *නැගෙනහිර හා උතුරු පලාතේ බෞද්ධ උරුමය.* දයාවංශ ජයකොඩි සමාගම. කොළඹ.

*ලාහුගල නීලගිරිය සෑය කැණීම් වාර්තා* :i 2011-2014. (අප්‍රකාශිත). පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව. කොළඹ.

සුරවීර, ඒ. වී. (1997) *රාජාවලිය.* අධ්‍යාපන ප්‍රකාශනය දෙපාර්තමේන්තුව. කොළඹ.

Somadeve, R. (2011) *Nilgiriseya survey* 2011. PGIAR Publication. Colombo.

විජේතුංග, සී. *පුන්කලස ශාස්ත්‍රීය ලිපි එකතුව.* (නීලගිරියෙන් හමුවන මහසෙන් රාජ්‍ය කාලයට අයත් ගිරි ලිපිය). පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව. කොළඹ.